**ගම්පහ මහා නගර සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
---------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 02 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 13 දිනද සභාවට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගම්පහ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග ලෙස ලද වටිනාකම රු.348,510 ක් වූ යන්ත්‍ර හා උපකරණ සහ පරිගණක 2 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | එම වත්කම් ස්ථාවර වත්කම් ලේඛනවලට ගෙන ස්ථාවර වත්කම් ගිණුම් වලට ගැනීමට 2019 වර්ෂයේ දී කටයුතු කරමි. |
| (ii) | පූර්ව වර්ෂ 3 කදී සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.8,779,400 ක් වටිනා වාහන 03 ක අයිතිය පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි. | අයිතිය පවරාගෙන ගිණුම්ගත කළයුතු වේ. | මෙම වාහන නගර සභාවට පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (iii) | ව්‍යාපෘති 2 කට අදාලව රු.55,627 ක් අඩුවෙන් සහ ව්‍යාපෘති 3 කට අදාලව රු.313,443 ක් වැඩියෙන් ණයහිමි ප්‍රතිපාදන සිදුකර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. | ණයහිමි වටිනාකම් නිවරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 08 කට අදාලව රු.2,470,484 ක් වූ ණයහිමි වෙන් කිරීම් සිදුකර තිබුණද මෙම ව්‍යාපෘති අවලංගු වී තිබුණි. | අවශ්‍ය ගිණුම් ගැලපීම් කළයුතු වේ. | යක්කල දඹුවවත්ත මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම, ව්‍යාපෘති පරීක්ෂා කරන ලද අවස්ථාවේදී එම ගොනුව ඉදිරිපත් කිරීමට නොතිබූ අතර ඉතිරි ව්‍යාපෘති 04 විවිධ හේතු මත අවලංගු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයේ කෙරවලපිටිය කසළ අංගනයට කසළ බැහර කිරීම වෙනුවෙන් ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු රු.10,211,236 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සළසා නොතිබුණි. | නිවැරදි වටිනාකම ණයහිමි ලෙස ගිණුම්ගත කළයුතු වේ. | පිළිතුරු දී නොමැත |
| (vi) | වටිනාකම රු.25,918 ක් වූ නැතිවූ තොගය සමාලෝචිත වර්ෂයේ තොග වටිනාකමින් ඉවත්කර නොතිබුණි. | නැතිවූ තොග ගිණුම්වලින් ඉවත් කළයුතු වේ. | අනුමැතිය ලබා ගෙන නියමිත පරිදි අපහරණ කටයුතු සිදු කළ පසු තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (vii) | ගිණුම් විෂයයන් 05 කට අදාලව ගිණුම් හා උපලේඛන අතර රු.6,188,474 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළයුතු වේ. | ලේඛන හා ගිණුම් අතර ශේෂයන්හි වෙනස නිවැරදි කිරිමට කටයුතු කරමි. |

**1.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමි ශේෂය වූ රු. මිලියන 118.7 තුල වර්ෂ 1-2 , 2-5, 5-10 අතර පිළිවෙලින් රු.මිලියන 58, රු. මිලියන 52.2, රු. මිලියන 8.4 ක් විය. | ණයහිමි ශේෂය නිරවුල් කිරිමට කටයුතු කළයුතු වේ. | 2019 වර්ෂයේදී ප්‍රවර්ථන වර්ෂයට අදාල වර්ෂය තුල වියදම් දරා ණය හිමි වෙන් කිරීම් අවම මට්ටමකින් ඇති කිරීමටද තව දුරටත් වගබලා ගනිමි . |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු විවිධ තැන්පතු ශේෂය වූ රු.මිලියන 40.7 තුල වර්ෂ 1-2, 2-5 , 5-10 හා වර්ෂ 10 ට වැඩි ශේෂ පිළිවෙලින් රු.මිලියන 16.7, රු.මිලියන 13.1, රු.මිලියන 4.9 ක් සහ රු.මිලියන 5.9 ක්ද විය. | විවිධ තැන්පතු ශේෂය නිරවුල් කිරිමට කටයුතු කළයුතු වේ. | ශේෂ සියල්ල පිළිබඳ සමාලෝචනයක් සිදු කර දේපල බදු දීම මත පවත්වා ගෙන යන තැන්පතු ශේෂ අවසන් ගිණුමේ වෙනම අනාවරණය කිරීමට කටයුතු කරමි . |

1.5 **අනුකූල නොවීම්**

1.5.1 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | 1971 අංක 48 පලාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් සිදුකරගත යුතු වුවද 2011 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරුව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල විය යුතු වේ. | වරිපනම් තක්සේරුව සිදු කර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මුදල් රෙගුලාසි 371 | 113,700 | ලබාගත් අත්තිකාරම් කාර්යය නිමවූ විගසම පියවිය යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. | කාර්ය නිම වූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළයුතු වේ. | ලබාගත් අත්තිකාරම් කාර්ය නිම වූ වහාම පියවා ගැනීමට වගබලා ගනිමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 24,044,424 | වර්ෂ 2 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | නියමිත කාලය ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ලේඛන යාවත්කාලීන කර ආදායමට ගැනීමට වන ශේෂ වේ නම් ආදායමට ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | අවම වශයෙන් වසර 05 කට වරක්වත් කඩ කුලිය තක්සේරු කල යුතු වුවද සභාව සතු කඩ කාමර 296 ක් සඳහා නව තක්සේරු | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතු වේ. | කඩකාමර සංකීර්ණවල යාවත්කාලීන තක්සේරුවක් ලබා ගැනීම සඳහා නිරන්තර පසු විපරම් ක්‍රමයක් සිදු කිරීමට කටයුතු කරමි. |

වාර්තා ලබා ගෙන
නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.114,443,685 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,534,964 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල මුදල | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 65,472,384 | 68,102,365 | 66,572,748 | 41,758,711 | 63,366,458 | 64,735,067 | 65,825,622 | 40,124,297 |
| කුලී | 28,676,282 | 29,410,995 | 32,221,453 | 252,375,123 | 29,302,956 | 37,217,535 | 22,866,353 | 27,765,861 |
| බලපත්‍ර ගාස්තු | 2,747,000 | 5,785,333 | 5,962,971 | 107,087 | 2,517,800 | 4,522,214 | 4,504,214 | 284,725 |
| වෙනත් ආදායම් | 297,676,510 | 309,699,030 | 396,787,819 | 114,398,836 | 241,631,844 | 204,862,478 | 274,118,325 | 201,484,454 |

#### 2.2.2 වරිපනම් හා බදු

--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු මුදල් රැස්කිරීම රු.මිලියන 66.5 ක් වූ අතර එයින් ප්‍රවර්තන වර්ෂයට අදාල වරිපනම් ආදායම රු.මිලියන 48.2 ක් විය. හිඟ වරිපනම් මුදල් ලැබීම රු.මිලියන 18.3 ක් විය. ඒ අනුව හිඟ වරිපනම් අයකිරීම් සියයට 45.6 ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීම කාර්යක්ෂම කළයුතු වේ. | ගම්පහ මහා නගර සභා සීමාවේ සියලු හිඟ දේපල වලට රතු නිවේදන නිකුත් කර ඇති අතර රු.5,000 ට වඩා වැඩි හිඟශේෂ සඳහා දේපල පවරා ගන්නා බවට අවසන් ලිඛිත දැනුම් දීම් සිදු කර ඇත. සමස්ත හිඟබදු අයකර ගැනීම සඳහා වග බලා ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 36.36 ක හිඟ වරිපනම් ශේෂය තුල වසර 10 ට වැඩි, වසර 5-10 ත්, වර්ෂ 2-5 ත්, වර්ෂ 1-2 ත් අතර පිළිවෙලින් රු.මිලියන 1.83 ක්ද, රු. මිලියන 14.37, රු. මිලියන 12.33 ක්ද, රු.මිලියන 7.8 ක්ද වශයෙන් හිඟ ශේෂ පැවතුණි. මෙම හිඟ ශේෂය තුළ රුපියල් ලක්ෂයට වැඩි ශේෂ 14 ක්ද, රු.50,000 ට වැඩි ශේෂ 27 ක්ද, යක්කල උප කාර්යාලයේ රු.50,000 ට වැඩි ශේෂ 06 ක්ද තිබුණි. | හිඟ වරිපනම් ශේෂය අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතු වේ. | දැනට හිඟ බදු අයවෙමින් පවතින අතර හිඟ බදු අයකර ගැනීමට නොහැකි බදු කරුවන්ගේ දේපල පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව පෙන්වා දෙමි. |

2.2.3 **විනෝද බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට විනෝද බදු හිඟ ශේෂය රු.5,149,577 ක් විය. ඉන් රු.4,192,178 ක් 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එක් සිනමා ශාලාවකින් අයවිය යුතු හිඟ ශේෂයකි. | හිඟ ශේෂ අයකර ගැනීම කාර්යක්ෂම කළයුතු වේ. | බදු පැහැර හැරීමට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට වග බලා ගනිමි. |

2.2.4 **කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මධ්‍යම බස් නැවතුම 1 අදියර කඩ කාමරයකින් රු.304,173 ක හිඟයක්ද, 4 වන අදියර කඩ කාමර 4 කින් වර්ෂ 10 ට වැඩි රු.67,400 ක හිඟයක්ද, මාළු කඩ 04 කින් වර්ෂ 10 ට වැඩි රු.12,637 ක හිඟයක්ද, මාකට් පටුමග කඩ 2 කින් රු.3,000 ක වර්ෂ 10 ට වැඩි හිඟයක්ද, පොදු වෙළඳපල 2 පියවර කඩ 4 කින් වර්ෂ 10 ට වැඩි රු.31,250 ක හිඟයක්ද විය. | හිඟ ශේෂ අයකිරිම කාර්යක්ෂම කළයුතු වේ. | ඉදිරියේදී එම මුදල් අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. |
| (ආ) | නගර සංවර්ධන ව්‍යාපෘතියේ කඩ කාමර 48 කින් 2008 වර්ෂයේ සිට පවතින හිඟය රු.මිලියන 11.11 ක් වූ අතර එය අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. 2008 අගෝස්තු 01 දින සිට ලබා දුන් නව තක්සේරුව බදුකරුවන් නොගෙවීම නිසා මෙම හිඟ ශේෂ ඇතිවී තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනිමට කටයුතු කළයුතු වේ. | පෙත්සම් කාරක සභාවේදී නිර්දේශය වී ඇති පරිදි කුලිය වසර 2 ක් තුල වාරික 24 කින් දඩ මුදල්ද සමඟ අයකල යුතු බවට 2018 සැප්තැම්බර් 10 දිනැති සභා තීරණය අනුව 2018 දෙසැම්බර් මස සිට වාරික වශයෙන් ගෙවන ලෙස දන්වන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | යක්කල පැරණි සති පොලේ පිහිටි කඩ 4 කින් 2012 වර්ෂයේ සිට රු.678,314 ක හිඟ කුලී ශේෂයක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ | 2012 ඔක්තෝබර් 08 දිනැති (264) අංක දරන සභා තීරණය මඟින් නව තක්සේරු කුලී ගෙවීම සඳහා සහනයක් ලබා දී තිබුණද එම කුලී සහනයටද අදාල බදු කරුවන් එකඟ නොවීම මත අදාල හිඟය තව දුරටත් පවතී. |
| (ඇ) | සභාවට අයත් මධ්‍යම බස් නැවතුම්පලෙහි කඩ 22 කින් හා පොදු වෙළඳ සංකීර්ණයේ කඩ 23 කින්ද, හිඟ පෙර මුදල් ශේෂය රු. මිලියන 36.87 ක් විය. එම හිඟ ශේෂය 2007 වර්ෂයේ සිට 2017 දක්වා වර්ෂ වලට අයත් විය.යක්කල වෙළඳ සංකීර්ණයේ කඩකාමර 49 කින් 2012 වර්ෂයේ සිට පෙර මුදල් හිඟ ශේෂය රු.මිලියන 63 ක් විය. | හිඟ පෙර මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | හිඟ පෙර මුදල් ගෙවීමට සහන කාලයක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමකට අනුව හිඟ මුදල් ගෙවීමට සහන කාලයක් ලබා දීම සුදුසු බවත් හිඟ පවත්නා සියලු කඩ හිමියන් වෙත එම තීරණය දන්වන ලෙසත් 2019 මැයි 10 දින සභා තීරණයක් දී ඇත. |

2.2.5 **බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති රු.84,587 ක හිඟ වෙළඳ බලපත්‍ර ශේෂය හා රු.113,200 ක හිඟ ව්‍යාපාර බදු ශේෂය අයකිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පූර්ව අයවැය ඇස්තමේන්තු සන්සන්දනය කර නිවැරදි ඇස්තමේන්තුකරණයන් සිදු කිරිමට 2019 වර්ෂයේදී වග බලා ගනිමි. |

2.2.6 **වෙනත් ආදායම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශය තුළ පවතින ආයතන 17 ක පරිසර බලපත්‍රවල වලංගු කාලය ඉක්මවා තිබුණ ද එම ආයතන පිළිබඳව පසුවිපරම් සිදුකර නොතිබුණි. | පරිසර බලපත්‍ර අළුත්කිරීමට කටයුතු කළයුතු වේ. | පරිසර බලපත්‍ර වලංගු කාලසීමාව අවසන් වී අලුත් කරගැනීම නොකර තිබූ ආයතන දැනුවත් කරමි. |
| (ආ) | 2018 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර අයදුම්පත් 24 ලැබී තිබුණ අතර ඉන් 12 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත්කර තිබුණද පරිසර බලපත්‍ර නිකුත් නොකළ ආයතනවලට බලපත්‍ර නිකුත් නොකිරීමට හේතු වාර්තා කර නොතිබුණි. | බලපත්‍ර නිකුත්කිරීමට කටයුතු කළයුතු වේ. | බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බලප්‍රදේශයේ ස්ථාපිත කර ඇති සියළුම දූරකථන කුළුණුවලින් වරිපනම් ආදායම් අය කර ගැනීමට හා එම කුළුණුවල සවිකර ඇති තරංග හුවමාරු උපකරණ අයත් ආයතනවලින් ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | බදු අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | වරිපනම් බදු ප්‍රතිශෝධනයන් ඇති කිරීමට හා ව්‍යාපාර බදු අයකිරිමටද අවශ්‍ය කටයුතු ඉටු කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 2015 දෙසැම්බර් 28 දින අංක 1947/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ඇතුලත් අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රචාරණ දැන්වීම් අයදුම්පත්‍ර සකස්කර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව අයදුම්පත් සකස් කළයුතු වේ. | 2015 දෙසැම්බර් 28 දින අංක 1947 / 6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ඇතුලත් අයදුම් පත්‍ර සංශෝධනය කර අයදුම්පත්‍ර නිකුත් කිරීමට ඉදිරි කටයුතු ඉටු කරමි. |

2.2.7 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 වර්ෂය සඳහා උසාවි දඩ රු.මිලියන 6 ක් ඇස්තමේන්තුකර තිබූ අතර කිසිදු මුදලක් ලැබී නොතිබුණි. | උසාවි දඩ මුදල් ලබාගැනීමට කටයුතු කල යුතුය. | 2018 වර්ෂයට ආදාල උසාවි දඩ මුදල් අය කර ගැනීමට නොහැකි වුවද 2019 ජනවාරි 21 දින වන විට ඊට ආදාල රු.7,224,184 ක මුදලක් අයකර ගෙන ඇති බව පෙන්වා දෙමි. |

## 3 . **මෙහෙයුම් සමාලෝචනය**

### 3.1 **කාර්යසාධනය**

මහනගරසභා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මහ නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 32 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 18 වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 541/17 හා 1989 ජනවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සම්මත වී ඇති අතුරු ව්‍යවස්ථා සභාව විසින් අවස්ථානුකුලව අදාල කර ගනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| (ii) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවාගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා කසළ බදු අයකලයුතු වේ. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් වැළඳගෙන තිබේ. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්කර නොතිබුණි. | ඉටුකල යුතු සියළු කර්තව්‍යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කළයුතු වේ. | පනවා ඇති අතුරු ව්‍යවස්ථා අනුව ඉටුකල යුතු කර්තව්‍යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

(ඇ) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනය වන විට යක්කල සාප්පු සංකීර්ණයේ පළමු අදියර කඩ කාමර 41 ක් සාදා අවසන්ව පැවති අතර ඉන් කඩ කුලියට දීමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගන්නේ කඩ කාමර 15 ක් වෙනුවෙන් පමණි. | කඩකාමර බදුදී ආදායම් උපයා ගැනීමට කටයුතු කළයුතු වේ. | සාදා නිමකර ඇති කඩකාමර 41 ක ටෙන්ඩර් කර ලබා දී ඇති අතර කඩ කාමර 15 ක ව්‍යාපාර ආරම්භකර ඇත.ඉතිරි කඩ කාමර 26 ගිවිසුම් ගත වීම සඳහා අදාල ගැණුම්කරුවන් වෙත ලිපිය මඟින් දන්වා ඇත. |

(ඈ) **අත්හැරදැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2003 වර්ෂයේදී වැඩ ආරම්භකර රු.5,230,606 ක් වැයකර ඉදිකර තිබූ මඩමවත්ත ගෘහස්ථ අත්පන්දු ක්‍රීඩාංගනය 2019 ජූනි 24 දින වන විටත් වහල මට්ටම දක්වා කොන්ක්‍රීට් කණු ඉදිකිරීම පමණක් සිදුකර අත්හැර දමා තිබුණි. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්තාවට අනුව , ප්‍රේක්ෂකාගාර පහසුකම් හෝ වෙනත් අවශ්‍ය කාර්යයන් සඳහා ඉඩකඩ නොමැති බව හා ඉදිකළ කොන්ක්‍රීට් සැකිල්ල වහලය සවිකිරීමට තරම් ප්‍රමාණවත් ශක්තියකින් යුක්ත නොවන බවත් දන්වා තිබුණි. | ඉදිකිරීම් ව්‍යාපෘති නිශ්චිත කාල වකවානු තුළ නිමකර අරමුණු සහ පරමාර්ථවලට අදාලව ප්‍රතිඵල ලබාගතයුතු වේ. | මඩමවත්ත ගෘහස්ථ අත්පන්දු ක්‍රීඩාංගනය සම්බන්ධව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව අනුව එම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට එම ආයතනය නිර්දේශ කර ඇත.ඒ අනුව කටයුතු කිරීමට සභා තීරණයක් ගෙන ඇත. |

(ඉ) **කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.1,000,000 කට ඇස්තමේන්තුකර 2017 අගෝස්තු 22 ආරම්භ කළ භූ ගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණ හා තොරතුරු තාක්ෂණ උපයෝගී කර ගනිමින් ගම්පහ මහා නගර සභාවේ කාර්යාලීය කටයුතුවල ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහනට සමාලෝචිත වර්ෂයේ රු.66,000 ක් වැයකර තිබුණි.එහෙත් ප්‍රමාණවත් මානව සම්පත් නොමැති වීම , ආයතනය තුල ඉටුකරන රාජකාරිවලට අමතරව මෙම ව්‍යාපෘතියෙහි රාජකාරි ඉටු කිරීමට සිදුවීම යන හේතු මත ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි. | GIS මෘදුකාංග භාවිත කටයුතු කාර්යක්ෂම කළයුතු වේ. | GIS මෘදුකාංග භාවිත කටයුතු ක්‍රමවත් කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ උපදේශන සේවා ඉල්ලා ඇත. |

(ඊ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 – 2023 දක්වා තිරසර සංවර්ධන සංයුක්ත සැලැස්මෙහි කෙටුම්පතක් සකස්කර තිබුණද 2018 වර්ෂයට අදාලව තිරසර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගත යුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සංවර්ධන සංයුක්ත සැලැස්ම සකස් කර ඇත. |

3.2 **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | 2016 මැයි 18 සිට මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරක්ද, 2018 දෙසැම්බර් සිට කළමනාකරණ සහකාර තනතුරක්ද, 2015 මාර්තු සිට ආදායම් පරීක්ෂක තනතුරු 02 ක් හා තාක්ෂණ නිලධාරි තනතුරක්ද 2017 ජනවාරි 20 දින සිට වෛද්‍ය නිලධාරි තනතුරක්ද, පුරප්පාඩුව තිබුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම පුරප්පාඩුවලින් ආදායම් පරීක්ෂක තනතුරු 02 හැර සෙසු පුරප්පාඩු පියවා ඇත. |
| (ii) | වර්ෂ 10 ට වැඩි කාලයක සිට පැවතෙන විශ්‍රාමික 34 දෙනෙකුගෙන් රු.264,105 ක ණය ශේෂයක්ද ස්ථාන මාරු හය දෙනෙකුගෙන් රු.9,509 ක ණය ශේෂයක්ද, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයට අනුයුක්ත වූ 7 දෙනෙකුගෙන් රු.35,170 ක ණය ශේෂයක්ද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අදාල ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කරමි. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභාවේ වරිපනම් දේපල 10930 ක් 2011 වර්ෂයේද, යක්කල උප කාර්යාලයේ දේපල 20130 ක් 2006 වර්ෂයේදී තක්සේරු කර වර්ෂ 7 ක් හා වර්ෂ 11 ක් ගතවී තිබුණි. මෙම දේපලවල වර්තමාන වටිනාකම පදනම් කරගෙන තක්සේරු ප්‍රතිශෝධනයක් සිදුකර නොතිබුණු අතර වරිපනම් දේපල ඒකක 31,060 කින් අයකල හැකි යාවත්කාලීන බදු ප්‍රමාණය අයකරගත නොහැකිවී තිබුණි. | කාලීනව වරිපනම් දේපල තක්සේරු කළයුතු වේ. | නව දේපල හඳුනාගනිමින් වරිපනම් බදු අයකිරීම දේපල පැවරුම් මත නව තක්සේරු වටිනාකම් තිරණය කිරීම , නේවාසික දේපල වාණිජ දේපල බවට මාරුකිරීම් වැනි හේතු මත උක්ත ඇස්තමේන්තුවල වෙනස් වීම් පිළිබිඹු කෙරේ. |

3.4 **වත්කම් කළමනාකරණය**

3.4.1 **පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේදී පළාත් පාලන අමාත්‍යාංශය විසින් මහා නගර සභාව වෙත ලබාදී තිබූ රු.30,069,519 ක් වටිනා මෝටර් වාහන 04 පවරා ගැනීමට 2019 ජූනි 27 දින වන විටත් කටයුතුකර නොතිබුණි. | මෙම වාහන නගරසභාව වෙත පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | වාහන නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |

3.4.2 **නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ගම්පහ පොදු වෙළඳපල තොග හා සිල්ලර වෙළඳ සංකීර්ණයේ ඉදිකර ඇති කඩ කාමර 28 ක් නිෂ්ක්‍රියව පැවතුණි | ආර්ථික ප්‍රතිලාභ ලැබෙන පරිදි සහා දේපල මෙහෙයවීම සිදුකළයුතු වේ. | එහි වෙළඳ පොළ තත්වයන් නොමැති වීම හේතුවෙන් ටෙන්ඩර් වී නොමැති බව පෙන්වා දෙමි. |
| (ආ) | සභාව සතු ත්‍රීරෝද රථය 2016 මාර්තු මස 19 දින සිදුවූ රිය අනතුර නිසා නිෂ්ක්‍රියව සභා පරිශ්‍රය තුල පවතින අතර එයට අදාල රක්ෂණ හිමිකම් මුදල් 2019 ජූනි 27 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | රක්ෂණ හිමිකම් ලබාගැනීමට කඩිනමින් කටයුතු කළයුතු වේ. | රක්ෂණ හිමිකම් ලබාගැනීමට කටයුතු කරමින් පවතී. |

### 3.4.3 වාර්ෂික භාණ්ඩ / තොග පරීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව වටිනාකම සඳහන් නොවූ කාර්යාල උපකරණ හා ලිබඩු අයිතම 429 ක ඌනතාවයක් හා අයිතම 87 ක අතිරික්තයක් පැවති අතර එම ඌනතා සහ අතිරික්ත සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතු වේ. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ උපදෙස් පරිදි කමිටුවක් පත් කර ඌණතා අතිරික්තතා ගැන සොයා බැලීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. |

### 3.5 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාදවීම නිසා පිළිවෙලින් රු.412,677 ක් හා රු.216,150 ක අධිභාර මුදල එම ආයතනවලට ගෙවා තිබුණි. | සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදලට ප්‍රමාදයකින් තොරව දායක මුදල් ගෙවීම් කළයුතු වේ. | සභාව විසින් ගෙවා නොතිබු හිග සේවක අර්ථ සාධක අරමුදල් හා ඒ වෙනුවෙන් පනවා ඇති අධිභාරය සඳහා මෙම මුදල් වාරික වශයෙන් ගෙවු බව දන්වා සිටිමි. |

### 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදීගැනීමට අපේක්ෂිත යන්ත්‍ර හා උපකරණ වෙනුවෙන් රු.1,224,575 ක් හා ලිබඩු හා උපකරණ රු.284,075 ක් වුවද වර්ෂය තුළ මිලදී ගත් ලිබඩු හා උපකරණ සහ යන්ත්‍ර හා උපකරණ පිළිවෙලින් රු.5,531,641 ක් හා රු.8,669,160 ක් විය. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදීගැනීම් කළයුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

### 3.6.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විමධ්‍යගත වැඩසටහන යටතේ වූ මාර්ග 04 ක් කොන්ක්‍රීට් කිරීමට රු.727,827 ක් ගෙවීම් කර | ඉදිකිරීම් සඳහා ගෙවීම් සිදුකිරීමේ දී අපේක්ෂිත | අදාල ව්‍යාපෘති 04 හි ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේදී |

| | | |
|---|---|---|
| තිබුණත්, එම මාර්ගවලට අදාල ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් කොන්ක්‍රීට් ස්ථරයේ ඝනකම භෞතික පරීක්ෂාවකින් සහ සම්පීඩන ශක්තිය පිළිබඳව රසායනාගාර පරීක්ෂාවකින් තහවුරු කරගෙන නොතිබුණි. | සම්පීඩන ශක්තිය රසායනාගාර පරීක්ෂණ වාර්තා වලින් තහවුරු කරගතයුතු වේ. | රසායනාගාර පරීක්ෂණ ඇතුලත් කර නොමැත |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව වැය විෂයයන් 37 ක් සඳහා වෙන්කරගත් රු. මිලියන 8.7 ක මුළු ප්‍රතිපාදන සම්බන්ධයෙන් ඉතිරි වී තිබුණි. | අපේක්ෂිත සැලසුම් නිවැරදිව හඳුනාගෙන ප්‍රතිපාදන වෙන්කර ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | සභා අරමුදල් මගින් ඉටුකිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 21 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.6,947,842 ක් වෙන්කර තිබුණද වර්ෂය තුළ නිමකර තිබුණේ වටිනාකම රු.3,700,526 ක් වූ ව්‍යාපෘති 12 ක් පමණි. | ඉටුකිරිමට අපේක්ෂිත ව්‍යාපෘති වර්ෂය තුළ නිමකළයුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මුල් මාස 06 හි විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණු අතර ජුනි 10 හා දෙසැම්බර් 17 යන දිනවල කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | නියමිත පරිදි කළමනාකරණ කමිටු පැවත්විය යුතු වේ. | 2018 වර්ෂයට විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා ඇත. |